**නල්ලූර් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 24 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 28 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් නල්ලූර් ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත පරිච්ඡේදය III - වගන්තිය 24 | සභාවට අයත් මාර්ග සහ පටු මාර්ග උපලේඛණය රජයේ ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පවරනු ලැබූ නිලධාරියා විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |
| (ඇ) | 1999 ජුනි 11 දිනැති අංක 14/199 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවක ණය ලබාගත් නිලධාරීන් විසින් සිදුකළ යුතු බහුමාන ප්‍රකාශය ණය ඉල්ලුම්කරුවන් විසින් අමුණා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.46,285,714 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.64,903,029 ක් විය. ආදායම රු.18,617,315 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට හේතුවිය.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ කාරක ප්‍රාග්ධනය රු.264,111,088 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ රු.234,885,808 ක් වූ අනුරූපී කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු.29,225,280 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | |
| | රු'000 | රු'000 | රු'000 |
| වරිපනම් හා බදු | 2,800 | 2,600 | 6,771 |
| බදු කුලී | 27,657 | 20,192 | - |
| බලපත්‍ර ගාස්තු | 2,362 | 5,162 | - |
| වෙනත් ආදායම් | 93,962 | 102,274 | 165,310 |
| එකතුව | 126,781 | 131,028 | 172,081 |

#### 2.3.2 වරිපනම් සහ බදු

රු.6,770,878 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් සහා බලයට යටත් දේපල යලි තක්සේරු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදු සහ කුලී**

-------------

(අ) රු.146,916 ක් වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) රු.974,123 ක් වූ හිඟ කුලී සභාව විසින් අයකර නොතිබුණි.

**2.3.4 මුද්දර ගාස්තු**

---------------

වටිනාකම රු.156,080,506 ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය තුලදී ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

2015 වර්ෂය අයවැය මඟින් ප්‍රතිපාදිත කර්මාන්ත පහක් ඉටු කිරීමෙන් තොරව මුලුමනින්ම අත්හැරදමා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

අයවැය ඇස්තමේන්තු විධිමත්ව පිළියෙල කර නොතිබුණි. එම නිසා ඇස්තමේන්තුගත වියදම සහ තත්‍ය වියදම අතර රු.199,349 සිට රු.4,109,078 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණන කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

---------------------------------------------

සභාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

----------------------------

**අක්‍රීය වත්කම්**

----------------

මිලට ගත් ඉඩමක් වසර දෙකක් තිස්සේ අක්‍රීයව පැවතුණි.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගෙවල් කුලී ලේඛණය

(ආ) කොන්ත්‍රාත්තු ලේඛණය

(ඇ) චෙක්පත් ලේඛණය

(ඈ) වාහන ධාවන සටහන්